# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2491/37 – 2026 ජුනි මස 03 වැනි බදාදා – 2026.06.03**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 (1) වැනි වගන්තිය යටතේ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පනවන ලද්දා වූ ද, අංක 1625/13 හා 2009.10.28 වැනි දින දරන රජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළකරන ලද්දා වූ ද, 2009 අංක 272 හා 2009.10.21 වැනි දින දරන ආඥාවේ සවිස්තරව දැක්වෙන ඉඩම් කොටස් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත පැවරී තිබේ. මෙහි පහත විස්තරවන ඉඩම් කොටස්වල භුක්තිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් මෙතෙක් භාර ගෙන නොමැත. එබැවින්, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය, කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39 (1) වැනි වගන්තිය යටතේ මාහට පැවරී ඇති බලතල අනුව අංක 1625/13 හා 2009.10.28 වැනි දින දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළකරන ලද ඉහත සඳහන් 2009 අංක 272 හා 2009.10.21 වැනි දින දරන ආඥාවේ පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස් පමණක් මෙම නියමය මගින් ප්‍රත්‍යාදිෂ්ඨ කරමි.

කේ.ඩී. ලාල් කාන්ත,
කෘෂිකර්ම, පශු සම්පත්,
ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය.

මගේ අංකය : LD/5/2008/PC/288
2026 පෙබරවාරි මස 12 වැනි දින,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
මිහිකත මැදුර, ඉඩම් මහ ලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මොරවක් කෝරළය සුළු කොට්ඨාසයේ, මතුගොබේ (අ.ග.පි. 169) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක MR/KTP/2008/439 හා 2009.01.28 දිනැති ප්‍රගමන අනුරේඛනයෙහි පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුත් ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි A - අනින්දලකැටිය හෙවත් අනින්කන්ද හෙවත් අනින්කන්දවත්ත - ප්‍රමාණය : හෙක්. 1.292**

උතුරට: වික්‍රමසිංහ ලෙව්පොත්දෙනියගේ ආරියදාස සහ තවත් අය හිමිකම් කියන අනින්කන්දවත්ත සහ මතුරට වැව්ලි සමාගම හිමිකම් කියන අනින්කන්ද වත්ත; නැගෙනහිරට: මතුරට වැව්ලි සමාගම හිමිකම් කියන අනින්කන්ද වත්ත; දකුණට: මතුරට වැව්ලි සමාගම හිමිකම් කියන අනින්කන්දවත්ත සහ අඩිපාර, වික්‍රමසිංහ ලෙව්පොත්දෙනියගේ ආරියදාස හිමිකම් කියන අනින්කන්දවත්ත සහ අබේවික්‍රම බමුණුසිංහ කංකානම්ගේ පියදාස හිමිකම් කියන අනින්කන්දවත්ත; බටහිරට: වික්‍රමසිංහ ලෙව්පොත්දෙනියගේ ආරියදාස හිමිකම් කියන අනින්කන්දවත්ත සහ අබේවික්‍රම බමුණුසිංහ කංකනම්ගේ පියදාස හිමිකම් කියන අනින්කන්දවත්ත.

EOG 06-0011